ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
**Chief Secretary's Office – North Western Province**
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල   மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல்   Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය   தாபனமும் நிறுவாக பிரிவு   **Establishment and Administration Division**

මගේ අංකය / எனது இலக்கம் / My No } NWP/CS/AD/22/10/8    ඔබේ අංකය / உமது இலக்கம் / Your No }    දිනය / திகதி / Date } 2023.05.04

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,

සභා ලේකම් - වයඹ පළාත් සභාව,

ලේකම් - වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

සියළුම පළාත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත.

**චක්‍රලේඛ වයඹ පළාත් සභාවට අදාල කිරීම**

භාණ්ඩාගාරයේ ලේකම් විසින් 2022.08.22 දිනැතිව නිකුත් කරන ලද PED 05/2022 අංක දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පහත සඳහන් කොන්දේසි /සංශෝධනයන් සහිතව වයඹ පළාත් සභාවට අදාල කර ගැනීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2023.04.27 දින ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක: NWP/GOV/AD11/23/2 හා 2023.04.28 දිනැති ලිපියෙන් මා වෙත දන්වා එවා ඇත.

02. මෙම චක්‍රලේඛය, www.treasury.gov.lk යන වෙබ් අඩවියෙන් භාගත කරගෙන අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය හා දිනය | විස්තරය |
|---|---|
| රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක: PED 05/2022 හා 2022.08.22 | ජ්‍යෙෂ්ඨත්වයට හානියක් නොවන පරිදි රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන්ට විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම. |

**කොන්දේසි/ සංශෝධනයන්:**

i. PED 05/2022 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හා ගිවිසුමෙහි දැක්වෙන රාජ්‍ය ව්‍යාපාර යන්නට පළාත් රාජ්‍ය ව්‍යාපාර එනම් පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අයතන හා අධිකාරී වශයෙන් ද එහි රාජ්‍ය ව්‍යාපාරයට අදාලව දක්වනු ලබන තනතුරු නාමයන් (උදා: විධායක නිලධාරීන්/අධ්‍යක්ෂ ජනරාල්) වෙනුවට පළාත් රාජ්‍ය ව්‍යාපාරයේ අදාල තනතුරු නාමයන් ආදේශ විය යුතුය.



ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதம செயலாளர் அலுவலகம் / Chief Secretary's Office } Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk
ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } Tel : 037-2223777, Fax : 037-2228019, e-mail : csnwp@sltnet.lk
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) / பிரதி பிரதம செயலாளர் (நிர்வாகம்) / Deputy Chief Secretary (Administration) } Tel : 037-2223195, e-mail : depcsnwp@sltnet.lk

ii. PED 05/2022 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.9 වගන්තිය පරිදි බැංකු පද්ධතිය හරහා තමන් නමින් ආරම්භ කරනු ලැබූ අනේවාසික විදේශ මුදල් ගිණුමකට නියමිත මුදල් ප්‍රේෂණය කළ යුතු අතර, එසේ ප්‍රේෂණය කිරීම පිළිබඳ තොරතුරු තම ආයතන ප්‍රධානියා වෙත එවීමට බැංකුව සමඟ එකඟතාවයක් ඇතිකර ගත් බව දැක්වෙන ලේඛනයේ පිටපතක් ආයතන ප්‍රධානියා වෙත නිවාඩු අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

iii. නිලධාරියා තම සේවා ස්ථානයෙන් හෝ වෙනත් මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබාගෙන ඇත්නම් සහ එය එකවර නොගෙවන්නේ නම් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට ප්‍රථම, වාරික වශයෙන් ගෙවීමට අදාලව බැංකුව සමඟ එළඹෙන එකඟතාවය පිළිබඳ අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ස්ථාවර නියෝගයේ පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

iv. ණය වාරික පියවීමට නියමිත කාල පරාසය තුල ගෙවනු ලබන වාරික පිළිබඳ වාර්තාවක් ආයතන ප්‍රධානියා වෙත එවනු ලබන බවට ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකුවෙන් තහවුරුවක් ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

02. මේ සම්බන්ධයෙන් අයදුම්කරුවන් සඳහා හඳුන්වා දෙන ලද ආදර්ශ අයදුම්පත්‍රය ද (ඇමුණුම-i) අවශ්‍යතාවල දී භාවිතා කල හැකි ස්ථාවර නියෝග ආකෘතිය ද (ඇමුණුම- ii) බැංකුව විසින් ආයතන ප්‍රධානියා වෙත දැනුම් දිය යුතු අනිවාර්ය ප්‍රේෂණ/වෙනත් ගෙවීම් පිළිබඳ විස්තර ආකෘතිය ද (ඇමුණුම- iii) ලෙස ඉදිරිපත් කරමි.

අයි.කේ.එම්.එම්.එස්. ඉලංගසේකර,
සහකාර ප්‍රධාන ලේකම් I(පරිපාලන).

අ/කළේ: රංජිත් ආරියරත්න
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත

ඇමුණුම - i

# වයඹ පළාත් රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන හා අධිකාරි සඳහා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ PED 05/2022 යටතේ විදේශීය රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ඉල්ලීමේ අයදුම් පත්‍රය.

## I කොටස

**දැනට ශ්‍රී ලංකාවේ සේවය කරමින් විදේශ නිවාඩු ඉල්ලුම් කරන නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු ආකෘතිය**

අදාල ස්ථාන වල ✓ ලකුණ යොදන්න / අනවශ්‍ය වචන, පාඨ කපා හරින්න

1. මුලකුරුසමඟ නම :- ................................................................................................
2. ජාතිකහැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐
3. සේවාව:-........................................................ තනතුර:- ........................................
4. වර්තමාන තනතුරේ සේවය ස්ථිර කර ඇත්ද? ඔව් ☐ නැත ☐
5. රාජකාරි ලිපිනය :- ................................................................................................
6. පෞද්ගලික ලිපිනය :- ................................................................................................
7. ඊමේල්ලිපිනය :- ................................................................................................
8. පුද්ගලික දුරකතන අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐
9. විදේශගත වන රට :- ................................................................................................
10. නිවාඩු කාලයේදී ලිපිනය (විදේශීය) :- ................................................................................................
................................................................................................
11. නිවාඩුව ආරම්භවන දිනය :- වර්ෂය ☐ මාසය ☐ දිනය ☐
12. නිවාඩුව අවසන්වන දිනය :- වර්ෂය ☐ මාසය ☐ දිනය ☐
13. මෙයට පෙර කුමන හේතුවක් මත හෝ වැටුප්රහිත පදනමෙන් (සම්පූර්ණ සේවා කාලය ඇතුළත) විදේශ නිවාඩු ලබාගෙන ඇත්ද ? ඔව් ☐ නැත ☐
14. ඉහත 13 සඳහා පිළිතුර "ඔව්"නම් එවැනි වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර දක්වන්න.

| # | රට | කාලසීමාව (සිට දක්වා) | නිවාඩු ලබාගත් කාරණාව |
|---|---|---|---|
| | | | |
| | | | |

5. වාරික වශයෙන් වැටුපෙන් අයවන ලෙස ලබා ගෙන ඇති සියලුම ණය මුදල් සම්පූර්ණයෙන් පියවා ඇතිද යන වග:-
ඔව් ☐ නැත ☐

ඉහත 15 සඳහා පිළිතුර "නැත" නම් බැංකු/මූල්‍ය ආයතනසමඟ එළඹී ඇති විශේෂ එකඟතාව ලිඛිතව ඉදිරිපත් කල යුතුය.

16. විශේෂ කරුණු ඇතොත් දක්වන්න................................................................................................
................................................................................................

අයදුම්කරුගේ ප්‍රකාශය:-

ඉහත සඳහන් තොරතුරු සෑම අතින්ම සත්‍ය හා නිවැරදි බවද , මෙම ඉල්ලීම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 05/2022 හි විධිවිධාන වලට අනුකූල වන බවද, මෙම කරුණ සම්බන්ධයෙන් වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති නිර්ණායක / මාර්ගෝපදේශ සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයට යටත්ව මෙම විදේශ නිවාඩුව අයදුම් කරන බව ද සහතික කරමි.

දිනය :- ................................

................................
(අයදුම්කරුගේ අත්සන)